# අතිනවීන කවීන්ගේ ස්ත්‍රීවාදී කාව්‍ය නිර්මාණ පිළිබඳ විමසුමක්

ඒ. පී. සුමාලි තක්ෂිලා ගුණසේකර[1]

කවිය විවිධාංගීකරණය වීමේ දී ස්ත්‍රිය මූලික කරගෙන නිර්මාණ බිහිවීම වනාහි සුවිශේෂ කරුණකි. පුරාණ සාහිත්‍යකරුවා ස්ත්‍රිය අද්භූත බලවේගයක් ලෙස දුටු අතර කොළඹ යුගයේ සාහිත්‍යකරුවා ඇය දුටුවේ කෙළිලොල් වස්තුවක් ලෙසිනි. එහෙත් නූතන කවීන් ස්ත්‍රිය පිළිබඳ ව වෙනස් ම අයුරක දෘෂ්ටියකින් කාව්‍යකරණයේ නියැලෙන අයුරු දක්නට ලැබේ. එයට බලපෑ හේතු රාශියක් තිබිය යුතු ය. විවිධාකාරයෙන් ශ්‍රමය සූරා කෑමකට මෙන් ම එයට පරිබාහිර වෙනත් පීඩනයන්ට ද ගොදුරු වන ස්ත්‍රී භූමිකා මෙකල කවීන්ගේ නිර්මාණ අතර හඳුනාගත හැකි ය. බොහෝ විචාරකයන්ගේ අදහස්වලට අනුව අතිනවීන කවිය ජනතාවාදී වීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රිය පිළිබඳ ව කතිකාවතක් ගොඩනැගේ. අතිනවීන කවීන්ගේ නිර්මාණවල අන්තර්ගත ස්ත්‍රීවාදී ලක්ෂණ විමසීමේ අරමුණින් සිදු කරන ලද මේ පර්යේෂණයේ දී අතිනවීන කවි පරපුර නියෝජනය කරන මොනිකා රුවන්පතිරණ හා යමුනා මාලනී පෙරේරා යන කිවිඳියන් දෙදෙනාගේ පද්‍ය නිර්මාණ කෘති ප්‍රධාන මූලාශ්‍රය වශයෙන් භාවිත කළ අතර සිංහල කවිය පිළිබඳ ව රචනා වී ඇති ද්විතීයික මූලාශ්‍රය රැසක් ද පරිශීලනය කෙරිණි. එහි දී අනාවරණය වූ පරිදි පුරාණ සාහිත්‍යයේ නිර්මාණය වන ස්ත්‍රී වර්ණනා බහුල කාව්‍ය ක්‍රමය අතිනවීන කවියේ දී වෙනසකට බඳුන් වී ඇති බව ප්‍රකාශ කළ හැකි ය. අතිනවීන කවි නිර්මාණය වන පසුබිමේ දී ස්ත්‍රියට එරෙහි ව නැඟුණු ප්‍රචණ්ඩත්වය හා සමාජ අසාධාරණය බඳු හේතු සාධක බහුල ය. මෙබඳු තත්ත්වයක් පාදක කරගනිමින් සිංහල කවි මඟෙහි දී ස්ත්‍රීවාදී කාව්‍ය නිර්මාණ රාශියක් නිර්මාණය වූ බව මේ පර්යේෂණයෙන් තහවුරු වේ.

**ප්‍රමුඛ පදඃ** අතිනවීන කවිය, ස්ත්‍රීවාදී කවි, ජනතාවාදී කවි, ස්ත්‍රී වර්ණනා, ස්ත්‍රී භූමිකා

---

[1] සිංහල අධ්‍යයනාංශය